මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, අංක.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක : PE/2024/35** **2024.10.22**

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024 නොවැම්බර් 14

## 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම

ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණය (2024) තරග කරනු ලබන සියලුම දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයින් විසින් 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ විධිවිධාන අනුගමනය කළ යුතු වේ. ඒ අනුව තරග කරන එක් එක් දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් / අපේක්ෂකයන් විසින් මැතිවරණ කොට්ඨාස මට්ටමින් මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා වියදම් කළ යුතු උපරිම වියදම් සීමා පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරු හා ස්වාධීන කණ්ඩායම් නායකයන්ගේ යෝජනා ලබාගෙන මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කර එම තොරතුරු ප්‍රසිද්ධ කොට ඇත.

අපේක්ෂකයා වෙනුවෙන් පිළිගනු ලැබූ හෝ භාරගනු ලැබූ පරිත්‍යාග හෝ දායකත්ව සහ එම පරිත්‍යාග හෝ දායකත්ව ද්‍රව්‍යමය වශයෙන් ලැබුණේ නම් ඒවායේ ඇස්තමේන්තු වටිනාකම, එකී දායකත්ව පරිත්‍යාග කරනු ලැබුවේ ත්‍යාග, ණය මුදල්, අත්තිකාරම් හෝ තැන්පතු වශයෙන් ද යන වග හා ප්‍රචාරක කටයුතු වෙනුවෙන් වියදම් කළ ආකාරය මැතිවරණ ප්‍රචාරක වියදම් හා ආදායම් වාර්තාවට ඇතුළත් විය යුතු අතර එම වාර්තාව මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර දින විසි එකක් (21) ඇතුළත අදාළ වන පරිදි පක්ෂ ලේකම්ගේ, ස්වාධීන කණ්ඩායම් නායකයාගේ සහ අපේක්ෂකයාගේ අත්සන, දිවුරුම් කොමසාරිස්වරයා හෝ සාමදාන විනිශ්චයකාරවරයා විසින් සහතික කොට ඒ ඒ තේරීම්භාර නිලධාරී වෙත භාර දෙනු ලැබිය යුතු ය.

මැතිවරණය තරග කිරීම සඳහා නාමයෝජනා භාරදුන් පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ දී ද ස්වාධීන කණ්ඩායම් නායකයන් සඳහා ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල දී ද පනත පිළිබඳ දැනුම්වත් කොට ඊට අදාළ තොරතුරු, උපදෙස් හා ආකෘතිපත්‍ර පිළිගත් නාමයෝජනා පත්‍ර ලබාදුන් සියලුම දේශපාලන පක්ෂවල බලයලත් නියෝජිතයන්, ස්වාධීන කණ්ඩායම්වල කණ්ඩායම් නායකයන් හා අපේක්ෂකයන් වෙත මේ වන විටත් භාර දී ඇත.

එබැවින් 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමන පනත මැනවින් අධ්‍යයනය කිරීම හා එහි සඳහන් විධිවිධාන අනුව කටයුතු කිරීම ඉතා වැදගත් බව මැතිවරණ කොමිෂන් සභාව විසින් අදාළ සියලු පාර්ශ්ව වෙත දන්වා සිටී.

ආර්.එම්.ඒ.එල්.රත්නායක
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)